සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No } DDD/HO/MF/02/05/08/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No } ........................................

දිනය / திகதி / Date } 2016.10.12

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන්,

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.

## දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් සඳහා, මාසික ගමන් වියදම් බැංකු අරමුදලින් ගෙවීම් කිරීම.

ඉහත කරුණ සම්බන්ධව මාගේ DDD/HO/MF/02/05/08/චක්‍රලේඛ දරණ 2016.09.21 දිනැති ලිපිය හා බැඳේ.

02. දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිවලට අනුයුක්ත ස්ථිර/ වැඩබලන කළමණාකරුවන්ගේ ගමන් වියදම් ගෙවීම් කිරීමේදී, අදාල ගමන් වියදම සහතික කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් සිදු කර ගත යුතු බව සඳහන් වේ.

එහිදී ඇතිවූ ප්‍රායෝගික ගැටලුවට විසඳුමක් ලෙස දිවිනැගුම ප්‍රජාමූල බැංකුව/ බැංකු සමිතිය හරහා ඍජුවම ගෙවීම් නොකර අදාල මුදල ප්‍රාදේශීය දිවිනැගුම අංශයට ප්‍රථමයෙන් ලබාදීම සිදුකල යුතුය.

03. ඒ සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතිය විසින් ඒ ඒ මාසවලට අදාල ගමන් වියදම් මුදල සඳහා චෙක්පතක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවිනැගුම අංශයේ නිල ගිණුමට ලබාදිය යුතුය. එහිදී වැය ගිණුම - කාර්ය මණ්ඩල දීමනා හා ගමන් වියදම් ගිණුම හර කර, සටහන් තැබිය යුතුය.

04. දැනටමත් පෙර උපදෙස් පරිදි ගමන් වියදම් ගෙවීම් කර ඇති බැංකු/ බැංකු සමිති ඉදිරි මාස සඳහා ගමන් වියදම් ගෙවීමේදී මෙම ක්‍රමවේදය අනුව සිදුකල යුතුය.

ඩී.ඒ.සුනන්දා පියසිලි,
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :- 01. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722**(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |